www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: කිලිනොච්චි ඇද වැටීම සිවිල් යුද්ධයේ හැරුම් ලක්ෂ්‍යයක් සලකුනු කරයි

## Sri Lanka: Fall of Kilinochchi marks turning point in civil war

**සරත් කුමාර විසිනි**
**2008 ජනවාරි 5**

මාස ගනනාවක දරුනු සටන්වලින් පසුව, බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පරිපාලන මූලස්ථානය වන උතුරේ කිලිනොච්චි නගරය අල්ලා ගත් බව ශ්‍රී ලංකාවේ මිලිටරිය සිකුරාදා නිවේදනය කලේය. කිලිනොච්චි ඇද වැටීම, එල්ටීටීඊයේ මිලිටරි පරාජයට ප්‍රාරම්භය විය හැකි ය. එහෙත් එය එසේ යයි ඔප්පු වුවත් එය දිවයින තුල සාමයේ හා සෞභාග්‍යයේ නව කාල පරිච්ඡේදයක පූර්ව නිමිත්ත වන්නේ නැත.

කිලිනොච්චි පිහිටා තිබෙන්නේ කොලඹ අගනුවර උතුරේ යාපන අර්ධද්වීපයට යා කරන ඒ 9 මහා මාර්ගයේ ය. එල්ටීටීඊය නගරය සහ එය වටා පිහිටි වන්නි කලාපයේ බොහෝ ප්‍රදේශ දශකයකට වැඩි කාලයක් තිස්සේ අල්ලා ගෙන සිටියේ උසාවි, පොලීසි හා පරිපාලන කාර්යාල ආදියෙන් සම්පූර්න තථ්‍ය අග නගරයක් බවට එය පරිවර්තනය කරමිනි. එය ඇද වැටීම, එල්ටීටීඊයේ ඉතිරිව පවතින එකම ප්‍රධාන මර්මස්ථානය වන ඊසානදිග වෙරලේ මුලතිව් නගරය දෙසට මිලිටරියේ නව තල්ලුවක් සඳහා මාවත විවෘත කරයි.

කිලිනොච්චි අල්ලා ගැනීම, ජනාධිපති මහින්ද රාජපක්ෂ 2002 සටන් විරාමය තථ්‍ය වසයෙන් ඉරා දමා 2006 ජුලි මාසයේ දී යුද්ධය යලි දියත් කල අවස්ථාවේ පටන් මේ දක්වා වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ පවතින මෘග සටන්වල කුලුගැන්වීමයි. එල්ටීටීඊයේ ශක්තිය ක්‍රමයෙන් හීන කිරීම ඉලක්ක කරගත් නිරන්තර ප්‍රහාරවලින් යුක්ත යුද්ධයක් ගෙනයනු පිනිස හමුදාව සිය සුපිරි පිරිස් බලය හා වඩා දැවැන්ත ගිනි බලය යොදාගෙන ඇත. එල්ටීටීඊය නැගෙනහිර පිහිටි එහි මර්මස්ථානවලින් පලවා හැරීමෙන් පසුව, 2007 මැද දී වන්නි කලාපය මත සිය මෙහෙයුම් යොමු කල මිලිටරිය, පසුගිය වසරේ අග භාගය වන විට එම කලාපයේ බටහිර භාගය අල්ලා ගෙන දකුනු ඉන්දියාවේ සිට එල්ටීටීඊයට පැවති සැපයුම් මාර්ග කපා දැමීය.

කෙසේ වෙතත්, එල්ටීටීඊය අධිෂ්ඨානවත් ආස්ථානයක් ගත් බැවින් කිලිනොච්චිය සඳහා වූ සටන මාස ගනනාවක් තිස්සේ දිගට ඇදී ගියේය. සිය තෑග්ග ප්‍රදර්ශනය කිරීමේ ආශාවෙන් පෙලෙන මිලිටරිය ඊයේ නගරය වටා ජාත්‍යන්තර වාර්තාකරුවන් ගෙන ගියේය. ආක්‍රමනික මෙහෙයුමට නායකත්වය දුන් මේජර් ජෙනරාල් ජගත් ඩයස් මාධ්‍යවලට මෙසේ පැවසීය: "කිලිනොච්චියට ඇතුලුවීම ඉතා අසීරු වැඩක් වුනා. කොටින්ගේ පස් බැම්ම සහ අගල් බිඳ දැමීමට මාස එකහමාරක් ගත වුනා."

දල වාර්තා සහ ඡායාරූප බෝම්බ දැමීමෙන් විනාශයට පත් ජනශූන්‍ය නගරයක් පෙන්නුම් කලේය. බොහෝ සිවිල් වැසියෝ මාසයකටත් වැඩි කලකට පෙර පලා ගියහ. එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවල ජනතාව ත්‍රස්ත කරනු වස් මිලිටරිය සිය කාල තුවක්කු හා ගුවන් බලය නැවතනැවතත් යොදා ගෙන තිබේ. ස්වාධීන මාධ්‍යවේදීන්ට යුද කලාප තුලට ඇතුලුවීමට අවසර දී නැති බැවින් සටන් පිලිබඳ නිවැරදි තොරතුරු ලබා ගත නොහැකිය. දෙපාර්ශ්වය ම වතාවතක් ලෙස ජීවිත හා ශාරීරික හානි පිලිබඳ සංඛ්‍යා ලේඛන විකෘත කරන නමුත් නගරය සඳහා ගෙන ගිය සටනේ දී සොල්දාදුන් හා එල්ටීටීඊ සටන්කරුවන් සිය ගනනක් ජීවිතක්ෂයට පත්ව තවත් බොහෝ සංඛ්‍යාවකට තුවාල සිදු වූ බවට බෙහෙවින් ඉඩ ඇත.

එල්ටීටීඊයට එරෙහි අවසන් ප්‍රහාරය ආරම්භ වූයේ පසුගිය සතියේ දී කිලිනොච්චියට උතුරෙන් ඒ 9 මාර්ගයේ පිහිටි පරන්තන් නගරය අල්ලා ගැනීමත් සමගය. තුන් පැත්තකින් වට කරන ලදුව, මුලුමනින් ම හුදකලා වීමේ හැකියාවට මුහුන දුන් එල්ටීටීඊ නායකත්වය නගරයේ පසුබැස්සේය. මොනම සහනයකට වත් ඉඩක් නැති බව ශ්‍රී ලංකා මිලිටරිය මේ වන විටත් පෙන්නුම් කර තිබේ. ක්ෂනික ඉලක්කය ලෙස පෙනී යන්නේ, යාපන අර්ධද්වීපයේ දකුනේ පිහිටි අලිමංකඩයි. 2000 දී එහි පිහිටි ප්‍රධාන මිලිටරි කඳවුරක් අල්ලා ගත්තේය. හමුදාව මුලතිව් දෙසට ද සිය ප්‍රහාර යොමු කරමින් සිටී.

එල්ටීටීඊයට එරෙහි මිලිටරි ජයග්‍රහනයක් වෙනුවෙන් සියල්ල පරදුවට තබා ඇති ආන්ඩුව කිලිනොච්චිය අල්ලා ගැනීම හැකි සියලුම ආකාරවලින් ගසාකයි. ජනාධිපති රාජපක්ෂ සිකුරාදා සතුටින් මෙසේ මොර දුන්නේය: "එය විස්තර කරන්න මොන වචන හෝ

භාෂාවක් යොදා ගත්තත් මෙය ඇත්ත වසයෙන්ම අසමසම ජයග්‍රහනයක්.” සිය නව-විජිතවාදී මිලිටරි වාඩිලාගැනීම් සඳහා බුෂ් පාලනාධිකාරය යොදා ගත් කඩතුරාව ම යොදා ගනිමින් ඔහු මෙසේ ප්‍රකාශ කලේයඃ “අපේ විරෝධාර හමුදාවන් සිදු කර ඇත්තේ එල්ටීටීඊයේ මහා බලකොටුව අල්ලා ගැනීම පමනක් නොව, ත්‍රස්තවාදයට එරෙහි ලෝක යුද්ධයේ මහා ජයග්‍රහනයක්.”

කෙසේවෙතත්, ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද නායකත්වයෙන් යුක්ත ආක්‍රමනවලට වඩා වැඩිමනත් අයුරින් “ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක්” නොවේ. යුද්ධය දිවයිනේ සිංහල බහුතර ප්‍රභූන් විසින් කම්කරු පන්තිය භේද කොට සිය පාලනය මුක්කු ගසාගැනීමේ විධික්‍රමයක් ලෙස අවුලුවන ලද දෙමල විරෝධී වෙනස්කම් කිරීමේ ඇටුවම් බැහැපු පිලිවෙතෙහි ප්‍රතිඵලයයි. 1970 ගනන්වල දී මතු වූ එල්ටීටීඊය, දිවයිනේ උතුරේ හා නැගෙනහිර දෙමල සුලුතරය සඳහා ස්වාධීන රාජ්‍ය කැබැලිත්තක් පිලිබඳ ධනේශ්වර ජාතිකවාදී වැඩපිලිවෙල මත පාදක වේ.

ජයග්‍රහනය සමරන උත්සව සංවිධානය කිරීමට ආන්ඩුව ප්‍රයත්න දැරුවත් දිග්ගැස්සෙන වාර්ගික යුද්ධයේ බර දැරීමට දිගටම සිදුව ඇති සාමාන්‍ය වැඩ කරන ජනතාව -- දෙමල හෝ සිංහල -- අතර ජයග්‍රාහී මනෝගතියක් නොමැත. 25 වසරක යුද්ධයේ දී 70,000කට වඩා මිය ගොස් ඇත. තවත් බොහෝ සංඛ්‍යාවක් තුවාල ලබා හා අංගවිකල තත්වයට පත්ව තිබේ. ලක්ෂ සංඛ්‍යාත ජනයා සිය නිවාසවලින් පලවා හරිනු ලැබ වසර ගනනාවක් තිස්සේ ජරාජීර්න සරනගත කඳවුරුවලට හිරවී එදා වේල පිරිමසා ගැනීමේ ජීවිතයක් ගත් කරති.

සටන් තව මාස ගනනාවක් තිස්සේ පැවතීමට ඉඩ ඇති තත්වයේ තියුනු ආපසුහැරීම් තව දුරටත් සිදු විය හැකි නමුදු හමුදාව එල්ටීටීඊයේ ඉතිරිව පවත්නා උතුරු මර්මස්ථාන අල්ලා ගැනීමට සූදානම් වන බව පෙනී යයි. එහෙත් මෙම “මුදාගැනීම්” දිවයිනට සාමය ගෙන එනු ඇතැයි බලාපොරොත්තු වන ඕනෑම අයෙක් තියුනු ලෙස අපේක්ෂාභංගත්වයට පත් වනු ඇත. නගර අල්ලා ගැනීමේ හා විවෘත සටන්වල නිරතවීමේ හැකියාවෙන් තොරව වුවත් එල්ටීටීඊය වසර ගනනාවක් තිස්සේ ගරිල්ලා යුද්ධයක් ගෙන යාමේ හැකියාව ඇත.

කෙසේවෙතත්, වඩා අතිමූලිකව ගත් කල, යුද්ධය නිර්මානය කිරීමට තුඩු දුන් දේශපාලන ප්‍රශ්න විසඳලීම තබා ඒවාට ආමන්ත්‍රනය කිරීමේ වත් ඓන්ද්‍රිය හැකියාවක් ආන්ඩුවට නැත. කිලිනොච්චි අල්ලාගැනීම නිවේදනය කරමින් රාජපක්ෂ මෙසේ ප්‍රකාශ කලේයඃ “එය වාර්ගික හා ආගමික පදනමක් මත ජනතාව භේද කිරීමට උත්සාහ කරන විෂකුරු බෙදුම්වාදයට එරෙහි ජයග්‍රහනයකි.” එහෙත් මෙය යථාර්ථය ඔලුවෙන් සිටුවීමකි. සියවස් කාර්තුවක කාල පරිච්ඡේදයක් තිස්සේ, කොලඹ අනුප්‍රාප්තික ආන්ඩු දිවයිනේ සිංහල ප්‍රභූන්ගේ බලය හා වරප්‍රසාද තහවුරු කරගනු වස් ප්‍රතිගාමී වර්ගවාදී යුද්ධයක් ගෙන ගොස් තිබේ. එල්ටීටීඊය තලා දැමීමෙන් අනතුරුව, වාර්ගික ගැටුම නොවැලැක්විය හැකි ලෙසම වෙනත් රූපාකාරයකින් පැන නගිනු ඇත.

තව දුරටත් කියතොත්, පසුගිය වසර දෙක තිස්සේ, ආන්ඩුව යුද්ධයේ ආර්ථික බර මුලුමනින්ම වැඩ කරන ජනතාව මත හෙලා තිබේ. ආරක්ෂක වැය ඉහල ගොස් ඇති අතර අධ්‍යාපනය, සුභසාධන හා සෞඛ්‍ය සේවා සඳහා වෙන් කෙරෙන අරමුදල් කප්පාදු කරනු ලැබ බඩු ඉහල දමා ඇත. විවේචකයන්ට, විරුද්ධවාදීන්ට සහ විරෝධතා පල කරන කම්කරුවන්ට, ශිෂ්‍යයන්ට හා ගොවීන්ට ජාතික ආරක්ෂාවට වල කපන්නන් සහ එල්ටීටීඊයේ අත් ශක්තිමත් කරන්නන් ලෙස රාජපක්ෂ චෝදනා කර තිබේ. ආන්ඩුව එල්ටීටීඊය “ත්‍රස්තවාදීන්” ලෙස හෙලා දකින අතර මිලිටරිය 2005 නොවැම්බරයේ දී රාජපක්ෂ බලයට පැමිනි අවස්ථාවේ පටන් සිය ගනන් ජනයා ඝාතනයට හා පැහැර ගැනීමට වගකිව යුතු ඝාතක කල්ලිවලට සම්බන්ධිතය.

සිකුරාදා පැවති සිය කතාවේ දී රාජපක්ෂ තවත් කැපකිරීමේ ඉල්ලා සිටියේය. “මෙම බොරු ඊලාම් අරගලයේ අවසන් ජවනිකාව එහි අවසානය දක්වා රග දක්වා” එල්ටීටීඊය “අවසාන වසයෙන් පරාජයට පත්” කරන “තෙක් . . . තවත් කෙටි කාලයකට ඔබ මෙම කැපවීම හා ඉවසීම පවත්වා ගෙන යාම අපගේ මව්බිමට අවශ්‍යය.” එහෙත් එල්ටීටීඊයේ ඉතිරිව පවතින මර්මස්ථාන අල්ලාගැනීම සමග කැපකිරීම් සඳහා වන ඉල්ලීම් අවසන් නොවනු ඇත. යුද්ධයේ පිරිවැය ගෝලීය මූල්‍ය අර්බුදය දිවයින මත ඇති කරන බලපෑම තවත් සංකීර්න කර ඇති අතර එය නොවැලැක්විය හැකි ලෙස ම විරෝධතා පැන නංවනු ඇත. එල්ටීටීඊයට එරෙහිව යොදා ගැනුනු මිලිටරි යාන්ත්‍රනය ම වැඩ කරන ජනතාවට -- සිංහල හා දෙමල එක සේ -- එරෙහිව හැරවෙනු ඇත.

කොලඹ දේශපාලන ජීවිතය මත වඩවඩා ස්වකීය මුද්‍රාව තබා ඇති මිලිටරිය මත්තෙහි රාජපක්ෂක ආන්ඩුව බොහෝ සෙයින් වාරු වී තිබේ. ආරක්ෂක හමුදාවන් ද සමස්තයක් ලෙස දේශපාලන සංස්ථාපිතය ද තුලට කාවැදී ඇති සිංහල අධිපතිවාදය ප්‍රකාශයට පත් කරමින්, යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා පසුගිය සැප්තැම්බරයේ දී කැනේඩියානු පුවත්පතකට කෙලින්ම මෙසේ පැවසීයඃ “මේ රට අයිති සිංහලයන්ට බව මම තරයේ විශ්වාස කරමි. රටේ බහුතරය, සියයට 75ක් වන, අපි කිසිදාක පරාජය භාර ගන්නේ නැහැ. මේ රට ආරක්ෂා කර ගැනීමේ අයිතිය ඇත්තේ අපට. ඔවුන්ට (සුලුතරයන්ට) මේ රටේ අප සමග වාසය කරන්න පුලුවන්. ඒත් ඔවුන් සුලුතරයක් වීමේ කඩතුරුව

යටතේ, අසාධාරන දේවල් ඉල්ලීමට උත්සාහ නොකල යුතුයි."

උතුර "මුදාගැනීම" කුමන ආකාරයක් ගනු ඇති ද යන්න නැගෙනහිර සිදුව ඇති දෙයින් දැනටමත් පැහැදිලි ය. පැහැර ගැනීම්, කප්පම් ගැනීම් සහ ඝාතන සඳහා කුප්‍රකට පැරා-මිලිටරි කන්ඩායමක නායකයකුගේ මූලිකත්වයෙන් යුක්ත පලාත් පරිපාලනයක් ආන්ඩුව එහි ස්ථාපිත කොට ඇත. මෙම "තෝරාපත්කර" ගත් ආන්ඩුව වනාහි කලාපය ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කිරීම එල්ල කරගත් මිලිටරි පාලනයක මුහුනත පමනි. ආන්ඩුවේ හා මිලිටරියේ අභිප්‍රාය වන්නේ, "මුදාගත් උතුර" තුල ද එම ක්‍රියාදාමය පුනර්කරනය කිරීමයි. වෙනත් ප්‍රදේශයක කම්කරු පන්තිය තුල විරුද්ධත්වයක් පැන නැගුන හොත්, එම විධික්‍රමයන් ම යොදා ගැනෙනු ඇත.

එල්ටීටීඊය සම්බන්ධයෙන් ගත හොත්, එහි මිලිටරි පසුබෑම් වනාහි එම සංවිධානයේ දේශපාලන ඉදිරිදර්ශනයේ බංකොලොත්කමේ ප්‍රකාශනයකි. එහි දෙමල බෙදුම්වාදය කොලඹ දේශපාලන සංස්ථාපිතයේ සිංහල අධිපතිවාදයෙහි දර්පන ප්‍රතිබිම්බයයි. එල්ටීටීඊය සාමාන්‍ය සිංහල වැඩ කරන ජනතාවට මොන යම් හෝ ආයාචනයක් කිරීමට අසමත්ව ඇතුවා පමනක් නොව, ආන්ඩුවේ යුද්ධය සම්බන්ධයෙන් සිංහල කම්කරුවන්ට දෝෂාරෝපනය කිරීම මගින් දෙමල හා සිංහල කම්කරුවන් අතර භේදයක් ද ඇති කර තිබේ. 1996 දී මහ බැංකුවට එල්ල කල කුප්‍රකට බෝම්බ ප්‍රහාරය වැනි, සාමාන්‍ය සිංහල ජනයාට එරෙහි එහි ප්‍රහාර, සිංහල අන්තවාදයේ මෝලට අවශ්‍ය ධාන්‍ය සැපයීය.

එල්ටීටීඊ දේශපාලන අංශයේ නායක බී. නඩේසන් නරක තත්වයක දී හැකි හොඳම මුහුන දමා ගැනීමට තැත් කරමින්, පසුගිය සතියේ දී *රොයිටර්* පුවත් සේවයට කියා සිටියේ එල්ටීටීඊයේ මූලෝපාය "නගරයක් හෝ නුවරක් මත කේන්ද්‍ර නොවන" බව සහ "භූමි ප්‍රදේශයක් අහිමි වීම සහ එය යලි අල්ලාගැනීම පොදු දෙයක්" බවයි. ඔහු තව දුරටත් මෙසේ පැවසීය: "අපගේ අරගලය එහි එල්ලය කරා ලගා වන තෙක් අපගේ නිදහස් සටන යුද නගර දිගට ම නිර්මානය කරනු ඇත." කඩා වැටෙන ධෛර්‍යය නගා සිටුවීමේ මංමුලා සහගත ප්‍රයත්නයක් ලෙස, එල්ටීටීඊය කොලඹ ගුවන් හමුදා මූලස්ථානය අසල සිකුරාදා සවස මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කොට ගුවන් භටයන් තිදෙනෙක් මරා දමා සිවිල් වැසියන් ඇතුලු තවත් 30කට තුවාල සිදු කලේය.

ආන්ඩුව සහ මිලිටරිය තවත් මර්දන මෙහෙයුමක් දියත් කරනු පිනිස කඩතුරාවක් ලෙස සිද්ධිය වහාම ඩැහැගත්තේය. කොලඹ හා ඒ අවට උප-නගර ප්‍රදේශවල දෙමල ජනයාට එරෙහි තවත් සෝදිසි මෙහෙයුමක් සති අන්තයේ ක්‍රියාත්මක වූ අතර 2003ට පසුව අගනුවරට පැමින ඇති සියලුම දෙමල ජනයා පොලිස් ස්ථානවල දී ලියාපදිංචි වන ලෙස අන කරනු ලැබ තිබේ.

වෙනම ඊලම් රාජ්‍ය කැබැලිත්තක් පිලිබඳ එල්ටීටීඊයේ කැඳවුම නිරතුරුවම පාදක කෙරී ඇත්තේ, එක්සත් ජනපදය හා යුරෝපා සංගමය වැනි මහ බලවතකුගේ හෝ බලවතුන්ගේ හෝ අධිපති කලාපීය බලවතා වන ඉන්දියාවේ සහයෝගය ලබාගැනීමේ බලාපොරොත්තුව මතය. කෙසේවෙතත්, 2003 දී සාම සාකච්ඡා බිඳවැටීමෙන් පසුව, එල්ටීටීඊය තථ්‍ය වසයෙන් ජාත්‍යන්තරව, විශේෂයෙන් ම එක්සත් ජනපදය විසින් හුදකලා කරනු ලැබ ඇත. බුෂ් පාලනාධිකාරය සම්බන්ධයෙන් ගතහොත්, සාම සාකච්ඡා, දකුනු ආසියාව තුල, විශේෂයෙන් ම ඉන්දියාවට සම්බන්ධිතව, එක්සත් ජනදය අවශ්‍යතාවන්ට තර්ජනය කරන යුද ගැටුමක් අවසන් කිරීමේ තවත් විධික්‍රමයක් පමනක් විය.

ඉන්දියාව වඩා සානුකම්පිත වනු ඇති බවට එල්ටීටීඊයට පැවති බලාපොරොත්තු, නිෂ්ඵල බව ඔප්පු වී තිබේ. ඉන්දියානු ආන්ඩුව දකුනු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තය තුල මහජන වෛරය සම්බන්ධයෙන් තවමත් සංවේදී වන නමුත්, එහි ප්‍රමුඛ උත්සුකතාව වී ඇත්තේ එල්ටීටීඊයේ අරගලය ඉන්දියාවේ බෙදුම්වාදී ව්‍යාපාර දිරිගැන්වීමෙන් වලකාලීමයි. නව දිල්ලිය ශ්‍රී ලංකාවේ මිලිටරියට පුහුනුව, ඔත්තු තොරතුරු හා උපකරන නිහඬව සම්පාදනය කරමින් සිටී. ඒ සඳහා ආංශික හේතුවක් වන්නේ, සිය කලාපීය ප්‍රතිවාදියා වන පකිස්ථානය කොලඹ තුල යම් පදනමක් දිනා ගැනීම වලකාලීම සහතික කරගැනීමයි.

එය මිලිටරිමය වසයෙන් පසුපසට තල්ලු කෙරී ඇති බැවින් එල්ටීටීඊය "ජාත්‍යන්තර ප්‍රජාවට" මැදිහත් වන ලෙස කරන ශෝචනීය ආයාචනාවලට ලඝු වී ඇත. මහ බලවතුන් ශ්‍රී ලංකා මිලිටරියේ නරකම ආන්තික ක්‍රියා සම්බන්ධයෙන් ඇල් මැරුනු විවේචන සිදු කර ඇතත්, පසුගිය වසර මුලදී ඔවුන්ගේ ආස්ථානය මුලුමනින් ම පැහැදිලි වූයේ රාජපක්ෂ ආන්ඩුව 2002 සටන් විරාමයෙන් නිල වසයෙන් ඉවත් වූ කල ජාත්‍යන්තරව විරෝධතා කෙඳිරිල්ලක් වත් පැන නොනැගුනු විට ය. කිලිනොච්චි ඇදවැටීමෙන් පසුව, ඉන්දියාව නිවේදනය කලේ, එල්ටීටීඊ නායක වී. ප්‍රභාකරන් පන පිටින් අල්ලා ගත හොත් හිටපු ඉන්දියානු අගමැති රජීව් ගාන්ධි ඝාතනය සම්බන්ධයෙන් ඔහු සිය රටට උදර්පනය කරන ලෙස තමන් ඉල්ලා සිටිනු ඇති බවයි.

ඉදිරියේ ඇති වන ක්ෂනික හැරීම් පෙරලීම් මොනවා වුවත්, මෙම ප්‍රතිගාමී යුද්ධයේ ජයග්‍රහනය හරහා ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනතාවගේ මූලික අවශ්‍යතා හා අභිලාෂයන් එකක් වත් ඉටු නොවනු ඇත.

© www.wsws.org